
# මැක්රොමීඩියා ඩිරෙක්ටර් හඳුනාගනිමු

**ඩිරෙක්ටර් යනු මෘදුකාංගයකි. පරිගණක ක්ෂේත්‍රයේ නියැලෙන අයට වුවද, 'ඩිරෙක්ටර්' නාමය තරමක් නුහුරු වදනක් විය හැක. 'එය පරිගණක බහුමාධ්‍ය (MULTIMEDIA) හසුරුවන අයට පමණක් විශේෂිත වූ මෘදුකාංගයක් බැවිනි.**




**අන්තර්ජාලය දියුණුවීමත් සමඟ, ඒ හා සම්බන්ධ වූ ප්‍රබල හා ජනප්‍රිය මෘදුකාංගයක් වන්නේ "මැක්රොමීඩියා ෆ්ලෑෂ්" ය.ෆ්ලෑෂ් මඟින් බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම හෝ වෙබ් පිටු නිර්මාණය හෝ පහසුවෙන් කරගැනීමට හැකිය. ෆ්ලෑෂ් නිපදවූ මැක්රොමීඩියා ආයතනයෙන්ම, DRICTOR බිහිවීම විශේෂ තැනක් ගනී."ඩිරෙක්ටර්" හා "ෆ්ලෑෂ්" යන මෘදුකාංග දෙකෙහිම බහු මාධ්‍ය අංග ලක්ෂණ දක්නට ඇතත්, ක්‍රියාකාරීත්වය අතින් ඒවා එකිනෙකට තරමක් වෙනස් වේ. එසේම ප්‍රබලත්වය අතින්, ඩිරෙක්ටර් අන් සියල්ලටම වඩා බහුමාධ්‍ය හා අන්තර්ජාල ක්‍රියාකාරකම් සඳහා ඉදිරියටම පැමිණ ඇත.**

බහුමාධ්‍ය , එනම්, රූපය, ශබ්දය, වීඩියෝපට, අක්ෂර සජීවිකරණ හා ඉදිරිපත් කිරීම් ආදි සියලු මාධ්‍යයන් සම්බන්ධ කළ හැකි මෙවැනි මෘදුකාංග කළින් කලට වෙළෙඳ පොළට පැමිණ තිබේ.

මෙම ගණයට තරමක් හෝ නැකම් කියන අප හොඳින් දන්නා මෘදුකාංගයකි, POWER-POINT. එය හුදෙක් එක් අයෙකුට හෝ විශාල හෝ යම් තොරතුරු සමූහයක් ඉතා සිත්ගන්නා අයුරින් පිටුවෙන් පිටුව ඉදිරිපත් කිරීම සඳහා (PRESENTATION) යොදගනී.ඇතැම් විට එය අක්ෂර, නිශ්චල රූප, ග්‍රැෆික් රූප, වීඩියෝ කොටස් (VIDEO CLIPS) හා සජීවිකරණ කොටස් ද ඇතුළත් විය හැකිය. (POWERPOINT XP වල මේ සඳහා බොහෝ පහසුකම් ඇතුළත් කර ඇත.)

අන්තර්ජාලය දියුණුවීමත් සමඟ, ඒ හා සම්බන්ධ වූ ප්‍රබල හා ජනප්‍රිය මෘදුකාංගයක් වන්නේ "මැක්රො-මීඩියා ෆ්ලෑෂ්" ය.ෆ්ලෑෂ් මඟින් බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම හෝ වෙබ් පිටු නිර්මාණය හෝ පහසුවෙන් කරගැ-නීමට හැකිය. ෆ්ලෑෂ් නිපදවූ මැක්-රොමීඩියා ආයතනයෙන්ම, DRIC-TOR බිහිවීම විශේෂ තැනක් ගනී."ඩිරෙක්ටර්" හා "ෆ්ලෑෂ්" යන මෘදුකාංග දෙකෙහිම බහු මාධ්‍ය අංග ලක්ෂණ දක්නට ඇතත්, ක්‍රියා-කාරීත්වය අතින් ඒවා එකිනෙකට තරමක් වෙනස් වේ.

එසේම ප්‍රබලත්වය අතින්, ඩිරෙක්ටර් අන් සියල්ලටම වඩා බහුමාධ්‍ය හා අන්තර්ජාල ක්‍රියාකා-රකම් සඳහා ඉදිරියටම පැමිණ ඇත.

අන්තර්ජාලයේ එන වෙබ් පිටු සඳහා වන සජීවිකරණ කොටස් නිපදවීමට FLASH බහුලව යොද ගන්නා අතර, අන්තර් ක්‍රියා සහිත බහුමාධ්‍ය සංයුක්ත තැටි නිපදවීමට DIRECTOR යොදගනී. මේ සඳහා ඔබට දියහැකි හොඳම නිදසු-නක් වන්නේ, එන්කාටා (ENCAR-TA) විශ්වකෝෂ සංයුක්ත තැටි-යයි.සමහරවිට ඔබද ඔබගේ පරිග-ණකයේ මෙම විශ්වකෝෂ තැටිය භාවිතා කර තිබෙන්නට පුළුවන.

FLASH මෙන් නොව, ඔබගේ තිරයේ එන්කාටා සංයුක්ත තැටිය ඉතා ඉක්මනින් විවෘත වන අතර, එහි රූප, ශබ්ද, කථනය, පසුබිම් සංගීතය, වීඩියෝ ක්ලිප්ස් හා සජී-වීකරණ කොටස් ඉතා පහසුවෙන් විවෘත වන අතර, එය භාවිතා කරන්නට අපූරු අත්දැකීමක් දේ.

ඔබත් මෙවැනි, අන්තර් ක්‍රියා (INTERACTIVE) සහිත සංයුක්ත තැටියක් නිපදවීමට කැමති නම්, DIRECTOR මඟින්, ඔබගේ අවශ්‍යතාව ඉටුකරගත හැකිය. එසේම අද වන විට, සමහර ව්‍යාපාරික ආයතන සම්මන්ත්‍රන-වලදී, තමන්ගේ නිෂ්පාදන හඳුන්වා-දීමට, POWERPOINT වලට වඩා DIRECTOR යොදගැනීමේ ප්‍රවණතාවක් දක්නට ඇත.

DIRECTOR මෘදුකාංගයක් නවතම සංස්කරණය වන්නේ, MACROMEDIA DIREC-TOR MX 2004 යන්නයි. 3d STUDIOMAX මෘදුකාංග ඇසු-රින් නිපදවනු ලබන ත්‍රිමාණ සජීවි-කරණ පවා DIRECTOR නව-තම සංස්කරණයට ඇතුළත් කළ හැකිය. පළමුව එළිදක්වා ඇත්තේ, ෆ්ලෑෂ්

ද, නැතහොත්, ඩිරෙක්ටර් ද කියා යමෙකු ඇහුවොත් දිය හැකි, පිළිතුර වන්නේ, ඩිරෙක්ටර් යනුයි.එනම් ආයතනයකින් බොහෝ දුරට එක සමාන මෘදුකාංග දෙකක් නිපදවීමට හේතු සහ ඩිරෙක්ටර්වල ඉතිහාසය, විශේෂයෙන්ම ඩිරෙක්ටර්වල විවිධ සංස්කරණයන්ගේ ඉතිහාසය සැකෙවින් පහත දක්වා ඇත.

## VIDEO WORKS - S1985

ජැමී ෆැන්ටෝන්, මාක් කැන්ටර් සහ මාක් පියර්ස් යන මෘදුකාංග ඉංජිනේරුවෝ 1984 දී 'මැක්රෝමයිඩ්" නම් පරිගණක වැඩසටහනක් නිෂ්පාදනය කොට එය "වීඩියෝ වර්ක්ස්"නමින් වෙළෙඳ පොළට නිකුත් කළහ. වර්ණ සංස්කරණයක් වූ මෙහි දෙවන සංස්කරණය VIDEO WORKS 11 නමින් 1987 දී නිපදවිණි. මේවා එකල ඇපල් මැකින්ටොෂ් HELP ලිපිගොනු සඳහා භාවිතයට ගැනුණි

## MACROMIND DIRECTOR - ( 1988 - 1992)

1988 දී 'විඩියෝ වර්ක්ස් ඉන්ටරැක්ටිව් ප්‍රෝ ' නම් මෘදුකාංගය ' ඩිරෙක්ටර් ' නමින් කා අතරත් ජනප්‍රිය වන්නට විය. මෙය ඩිරෙක්ටර් පවුලේ පළමු සංස්කරණය (DIRECTOR -01 ) ලෙස හැඳින් වේ. ජෝන් තොම්සන් සහ එරික් තියුමන් යන දෙදෙනා මෙහි මෙතෙක් පැවති මූලික පරිගණක භාෂාව වෙනස් කර, (LINGO SCRIPTING LANGUAGE) ලින්ගෝ භාෂාව ඇතුළු කළහ.

මේ කාලයේදී , "වීඩියෝ වර්ක්ස් ඩිරෙක්ටර්" මෘදුකාංගය STAR TREK නමැති ලෝ පතල චිත්‍රපටියේ පසුබිම් දර්ශන තැනීමට යොදා ගන්නා ලදී.

කෙසේ වෙතත් ඩිරෙක්ටර් මෙතෙක් භාවිතා කළේ 'ඇපල් පරිගණකවල පමණි.



## DIRECTOR 3 - 1992

මෙය ද ඇපල් මැකින්ටොෂ් පරිසරයේ සුලබ මෙවලමක් විය. එහෙත් මැක්න්ටොෂ් ඩිරෙක්ටර්වලින් නිපදවන ලද චිත්‍රපට (සජීවිකරණ දර්ශන) එකල තිබූ වින්ඩෝස් 3 . 1 මගින් වාදනය කිරීමේ හැකියාව තිබුණි.

## MACROMIND DIRECTOR 3 .1. 3

මෙනමින් නිකුත් වූ මෘදුකාංගය ප්‍රථම වරට "මැක්රෝමීඩියා " ලෙස වෙනස් වූයෙන් , එය මැක්රෝමීඩියා ඩිරෙක්ටර් 3 ලෙස කළ එළි බැසීය.

## MACROMEDIA DIRECTOR 4 - 1993

මෙය මැගින්ටොෂ් සහ වින්ඩෝස් යන ක්‍රම දෙකටම භාවිතා කළ හැකිවීම විශේෂත්වයකි. ලින්ගෝ භාෂාව ද මෙහි වැඩි දියුණු කර තිබුණි.

**ජැමී ෆැන්ටෝන්, මාක් කැන්ටර් සහ මාක් පියර්ස් යන මෘදුකාංග ඉංජිනේරුවෝ 1984 දී 'මැක්රෝමයිඩ්" නම් පරිගණක වැඩසටහනක් නිෂ්පාදනය කොට එය "වීඩියෝ වර්ක්ස්"නමින් වෙළෙඳ පොළට නිකුත් කළහ. වර්ණ සංස්කරණයක් වූ මෙහි දෙවන සංස්කරණය VIDEOWORKS 11 නමින් 1987 දී නිපදවිණි. මේවා එකල ඇපල් මැකින්ටොෂ් HELP ලිපිගොනු සඳහා භාවිතයට ගැනුණි**

## DIRECTOR SHOCKWAVE - 1995

SHOCKWAVE නම් උපාංගය නිපදවූයේ DIRECTOR මගින් නිපදවූ නිර්මාණ නැවත වාදනය (REPLAY) කොට මොනිටරයක් බලාගැනීම සඳහාය.

## DIRECTOR 5 - 1996

DEBUGGES සහ MULTI CAST යන උපාංගද, ලින්ගෝ කොමාන්ඩ් ( විධානයන්) ද මෙහිදී DIRECTOR වලට එකතු කරන ලදී.

මේ වකවානුවේදී තවත් අපූරු සිදුවීමක් සිදුවෙමින් පැවතිණි. FUTUREWAVE නම් සමාගමක් මගින් SMART SKETCH නම් වූ චිත්‍ර අඳින මෘදුකාංගයක් නිෂ්පාදනය කළේය. එය FUTIRE SPLASH නමින් තවත් දියුණු කොට අන්තර් ජාලය සඳහා තවත් වැඩි දියුණු කරන ලදී. මේ මෘදුකාංගය ඇඩෝබ් සමාගමට ප්‍රදනය කළත්, එය අසාර්ථක විය. මැක්රෝමීඩියා ආයතනය වහා ඉදිරිපත්වී එය මිලට ගත්තේය. අවසානයේදී එය එනම්, 1996 දී PLASH - 01 ලෙස ලොවට බිහිවිය.

## DIRECTOR 6 -1997

මෙය DIRECTOR MALTI-MEDIA STUDIO ලෙස හඳුන්වා තිබූ අතර BEHAVIOR නම් විධානයත් එකතුකර තිබුණි. එසේම SHOCKWAVE උපාංගයද එහිම අන්තර්ගත කොට තිබුණි.

## DIRECTOR 6 . 5

QUICKTIME 3 මගින් ඇතිකරනු ලැබූ යම් යම් ගැටලු මෙම සංස්කරණයේ දී ඉවත්කොට තිබුණි.

## DIRECTOR 7 - 1998

මෙකල අන්තර් ජාලය ජනප්‍රියව තිබූ බැවින් මෙම සංස්කරණය වෙළෙඳ පොළට පැමිණියේ SHOCKWAVE INTERACTIVE STUDIO යන නාමයෙනි. SHOCKWAVE මගින් නැවත වාදනය කිරීමේ වේගය අඩුවී පැවතීම මෙහි එක් දුර්වලතාවයකි.

## DIRECTOR 8 - 2000

DIRECTOR 7 ට වඩා උපාංග මෙහි අඩු වුවත්, මෙහි නම්‍යශීලී බව හා පහසුවෙන් හැසිරවිය හැකිවීම වැදගත් තැනක් ගනී.

## DIRECTOR 8 . 5

මදක් වැඩි දියුණු කරන ලද්දකි. ත්‍රිමාණ සජීවිකරණ කොටස් සහ FLASH ලිපිගොනු මෙයට ඇතුළත් කිරීමේ හැකියාව තිබුණි.

## DIRECTOR MX 2004 - 2004 ජනවාරි

මෙම වසරේ මුල මෙය එළි දැක්වුණි. එයට FLASH MX ලිපිගොනු ඇතුළත් කිරීමේ හැකියාව ඇති අතර ඕනෑම ත්‍රිමාණ සජීවීකරණයන් ද ඇතුළත් කිරීමේ හැකියාව ඇත. එසේම LINGO SYHTAX නමැති විධානයන් වෙනුවට JAVA SYNTAX විධාන ඇතුළත් කොට නිපදවූ සංස්කරණයකි. ❐

**අයෝම ජයසිංහ**